# ආර්යයෝ කවරහු ද අනාර්යයෝ කවරහු ද

## අනාර්ය පිරිස හා ආර්ය පිරිස ගැන දෙසූ දෙසුම ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 1, දුක නිපාතය
- පිටු අංක 138 - 141)

අනාර්ය පිරිස කවුරුන් ද යත්;

මෙ සස්නෙහි යම් භික්ෂු පිරිසක්,

- මේ දුක යැයි තත් වූ පරිදි මනා සේ නොදනිති.
- මේ දුකේ හටගැනීම යැයි තත් වූ පරිදි මනා සේ නොදනිති.
- මේ දුකේ නිරෝධය (සමූල ඝාතනය) යැයි තත් වූ පරිදි මනා සේ නොදනිති.
- මේ දුක්ඛ නිරෝධය සඳහා වූ ප්‍රතිපදාව යැයි තත් වූ පරිදි මනා සේ නොදනිති.

මේ අනාර්ය පිරිස යැයි කියනු ලැබෙයි.

ආර්ය පිරිස කවුරුන් ද යත්;

මේ සස්නෙහි යම් භික්ෂු පිරිසක්,

- මේ දුක යැයි තත් වූ පරිදි මනා සේ දනිති.
- මේ දුකේ හටගැනීම යැයි තත්වූ පරිදි මනා සේ දනිති.
- මේ දුකේ නිරෝධය යැයි තත් වූ පරිදි මනා සේ දනිති.
- මේ දුක්ඛ නිරෝධය සඳහා වූ ප්‍රතිපදාව යැයි තත් වූ පරිදි මනා සේ දනිති.

මේ ආර්ය පිරිස යැයි කියනු ලැබෙයි.

මේ පිරිස් දෙක අතරින් යම් ආර්ය පිරිසක් වේ ද ඒ අය ම අග්‍ර වෙති.